27

විවාහය

" وَأَنْكِحُوا الْأَيَامَى مِنْكُمْ وَالصَّالِحِينَ مِنْ عِبَادِكُمْ وَإِمَائِكُمْ "
(سورة النور)

"නුඹලා අතර සිටින තනිකඩ අයට ද, (ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට) නුඹලාගේ වහලුන් හා වහලියන් අතර දැහැමියන්ට ද විවාහ සිදු කර දෙනු..." (24:32)

ඉස්ලාමීය ජීවිතයේ පදනම වන්නේ පවුල ය. මේ නිසා සමහර විද්වතුන් ඉස්ලාම් දහම පවුල හා සැබැඳි ආගමක්, යැයි වර්ණනා කර ඇත. පවුල යනු කුඩා සමාජයකි. එය සුවිසල් සමාජයක ප්‍රාරම්භක ඒකකය යි. බීජය නිරෝගී ව තිබේ නම් ගස නිරෝගී ව වැඩෙන්නා සේ ම. නිවැරදි පවුල බිහි වූ විට හොඳ සමාජයක් බිහි වේ. ශක්තිමත් පවුලක් සමාජය බල සම්පන්න කරන අතර එහි දුබලතා සමාජය දුබල කරයි.

අල් කුර්ආනය පවුලට ඉතා වැදගත් කොට සලකා ඇත. ඒ සම්බන්ධ නීති රීති ඊමානය හා ඒකාග්‍ර වන අයුරු විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත. බොහෝ තැන්වල නබිවරුන්ගේ පවුල් ගැන ද ප්‍රකාශ වේ.

සමාජයේ පදනම වන පවුලේ ව්‍යුහය විවාහයෙන් ශක්තිමත් වේ. ඉස්ලාම් දහම, එය නබිවරුන්ගේ මග යැයි දේශනා කරයි; ඒවායේ නිරත වන ලෙස අණ කරයි. ඒ සඳහා දිරිමත් කරයි.

"නුඹලාගෙන් ජීවනාධාර නොමැති අය විවාහ කර තබන්න" (24: අන් නූර් 32)

"තරුණයනි, ශක්තිවන්තයින් විවාහ වන්න. මක්නිසා ද යත් එය බැල්ම පාලනය කරයි. රහස්‍ය පෙදෙස ආරක්ෂා කිරීම ද විශිෂ්ට එකකි. ශක්තිය නොමැති පුද්ගලයන් (උපවාස) ශීලය රකින්න. එය ඔහුට ආරක්ෂාව ලබා දේ." (බුහාරි)

ඉස්ලාම් දහමේ නීති විශාරදයන් විවාහය ගැන නීතිමය තීන්දු කිහිපයක් ඉදිරිපත් කර ඇත. මේ අනුව කායික ශක්තිය හා ආර්ථික වශයෙන් බලවත් යම් පිරිමියකු විවාහ වීම සුන්නතයකි. මෙවැනි තැනැත්තකු අකුසල්හි නිරත වීම ගැන බියවන්නේ නම් විවාහවීම වාජිබ් වේ. මේ කොන්දේසිය ස්ත්‍රීන්ට ද අයත් වේ. නමුත් ආර්ථික වශයෙන් වන කොන්දේසිය ඇයට අදාළ වන්නේ නැත.

ෂරිආවේ දැක්මෙන් විවාහයේ අරමුණු ලෙස පහත සඳහන් ඒවා සැලකිය හැක.

1. සාලිහ් වූ පරම්පරාව බිහි කිරීම

සාලිහ් වූ පරම්පරාව බිහි කිරීම, යන්නෙන් මිනිසාගේ දිගු කාලීන පැවැත්ම සටහන් කරයි. විවාහයේ එක් ප්‍රතිඵලයක් නම් "සුර්රියත්" (උතුම් පරපුරක්) බිහි කිරීම යන අදහස අල් කුර්ආනය හා සුන්නාව දේශනා කරයි. ඒ නිසා දරුවන් වැදීම යන සීමාව ඉක්මවා දිගු කාලීන පරම්පාරවක් බිහි කිරීම මෙහි අදහස වේ. ඒ නිසා විවාහය මිනිස් සංහතියේ පැවැත්ම සඳහා වූ යාන්ත්‍රණයක් වේ.

2. කායික හා මානසික ශාන්තිය ඇති කිරීම

විවාහය යනු ලෝකයේ පිරිමියා හා ගැහැනිය ළඟා කර ගන්නා මහත් වින්දනයක් සතුටක් හා තෘප්තියක් ද වේ. එය ශාරීරික හා මානසික සංතුෂ්ටිය ඇති කරයි.

"නුඹලා සන්සුන් වීමට නුඹලාගෙන් ම යුවලක් මවා තිබීම හා නුඹලා අතර ආදරය හා කරුණාව ඇති කර තිබීම අල්ලාහ්ගේ සාක්කිවලින් එකකි. (30 රූම් : 21)

විවාහය මිනිසකු තුළ සන්සුන් බව හා සවිඥානක බව මෙන් ම, නිසිලෙස කාර්යන් ඉටු කිරීමේ හැකියාව ද අපරිමිත වගකීම් සහිත බවක් ද ගෙන දෙයි. මානසික සන්සුන් බව කෙනකුගේ හැකියාවන් වැඩි කරයි; කාර්යක්ෂමතාව කිහිප ගුණයකින් වැඩි කරයි. මේ නිසා අල් කුර්ආනය ස්වාමියා හා බිරිඳගේ බැඳීම සකීන් (සන්සුන්භාවය) යන වදනෙන් පැහැදිලි කරයි.

කායික සන්සුන් බව අකුසලින්, ආපරාධවලින්, මාරාන්තික හා සමාජ රෝගවලින් ආරක්ෂා ලබා දෙයි. අල් කුර්ආනය විවාහ වුණු කෙනකුට 'මුහ්සන්' යන වචන ය භාවිත කරයි. මෙම වචනය 'හිස්න්' (ආරක්ෂක කොටුව) යන වචනයෙන් ආ පදයකි.

එනිසා මෙහි දී විවාහය යනු ආරක්ෂක කොටුවක් ලෙස සලකනු ලැබේ. විවාහ වුණු පුද්ගලයා එම කොටුව තුළ ආරක්ෂාකරී ලෙස සිටියි, යන අදහස ලබා දෙයි. තව ද අපරාධ ක්‍රියාවලින් ආරක්ෂා වේ. ඉබාදත් කිරීමේ දී සිත සන්සුන් කිරීමට මග පෙන්වයි. කවරකු හෝ විවාහ වෙනවා නම් ඔහු තමන්ගේ ආගමේ අඩක් සම්පූර්ණ කළ තැනැත්තා ද වේ.

3. හොඳ සමාජ ක්‍රමය ඇති කිරීම.

ස්වාමියා හා බිරිඳ මගින් ඇති වන පවුල, සමාජ ක්‍රමයට පදනම වේ. ඒ දෙදෙනා අතර ඇති විධිමත් බව තහවුරු වීමේ දී පවුල් ඒකකයේ විධිමත් බව තහවුරු වේ. පවුල් ජීවිතය සන්සුන් හා විධිමත් වූ විට සමාජය නිවැරදි මගෙහි මෙහෙයවේ.

"දෙවියෙනි! අපේ බිරින්දෑවරුන් පරම්පරාව හා දරුවන් මගින් අපට ආස්වාදයක් ලබා දෙනු. අප මුත්තකීන්වරුන්ගේ නායකයන් බවට පත් කරනු මැනව..." (25 : ෆුර්කාන් 74)

විවාහය වගකීම් සහගත බව ඇති කරමින් හොඳ සමාජ ක්‍රමයක් තහවුරු කරයි. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්, පවුලේ වගකීම හා සමාජ වගකීම් සම්බන්ධ කර කථා කර ඇත.

"අපේ නායකයා වගකීමෙන් යුත් තැනැත්තෙකි, ඔහු ජනයා පිළිබඳ වූ ප්‍රශ්න කිරීමට ලක් වෙයි. පිරිමියා තම පවුලේ භාරකරු වේ. ඔහුගෙන් පවුල ගැන විමසනු ඇත. ස්ත්‍රිය තමන්ගේ නිවසට දරුවන්ට භාර කාරියයි. ඇය මේ ගැන විමසුමට ලක් වෙයි. (බුහාරි)

මෙවැනි අරමුණු සාක්ෂාත් කිරීමට තුඩුදෙන විවාහය නැමදුමකි. විවාහය හැඳින්වීමට භාවිත කරන "නිකාහ්" යන අරාබි පදය "නකහ" යන අරාබි වචනයෙන් බිහි විය. ඉස්ලාමීය භාවිතයේ දී නිකාහ් යනු ගැහැනිය හා පිරිමියා ස්වාමියා හෝ බිරිඳ යන තත්ත්වය ආගමික වශයෙන්, නෛතික වශයෙන් හා සමාජීය වශයෙන් උසස් කිරීම දේව භක්තියෙන් යුතුව සිදු කරගන්නා ගිවිසුමකි. අල්ලාහ්ගේ නාමයෙන් මුස්ලිම් සමාජයේ සාක්කි ඉදිරියේ ඉටු වන නිසා නැමදීමක් ලෙස හා සමාජීය වගකීමක් ලෙසට මෙය පත් වෙයි.

විවාහ ගිවිසුම බලාත්මක වීමට බොහෝ නීති රීති ඇත. අජ්නබි ගණයට අයත් පිරිමි හා ගැහැනු එකිනෙකා විවාහ වීමට අනුමැතිය ඇත. තමන්ට මහ්රම් වූ යමෙක් විවාහ වීම හරාම් වේ. දැන් මහ්රම් වූවන් කවුරුන් ද යන්න සොයා බලමු.

මහ්රම්

විවාහ වීමට අනුමැතිය නොමැති ඉතා කිට්ටු ම ඥාතීන් 'මහ්රම්' වේ. මෙය කොටස් දෙකක ට බෙදේ. එය

1. ස්ථිර මහ්රම්
2. තාවකාලික මහ්රම්

ස්ථිර මහ්රම්

යම් පුද්ගලයකුට යම් යම් ඥාති ස්ත්‍රීන් විවාහ වීම ඉස්ලාම් ධර්මය හරාම් කර ඇත. මෙම හරාම් වූ තත්ත්වය කුමන හේතුවක් නිසා වුව ද නොවෙස් ව ස්ථිර ව තිබේ. මෙය ස්ථිර මහ්රම් යනුවෙන් හැඳින්වේ. මෙම තත්ත්වය හේතු තුනක් නිසා ඇති විය හැක.

1. රුධිර සබඳතා
2. විවාහ සබඳතා
3. කිරි බී වැඩීම නිසා ඇති වන සබඳතා

මෙම සබඳතා නිසා විවාහ වීමට අනුමත නොකරන්නන් පහත සඳහන් වේ.

1. මව, මවගේ මව ලෙස ඉහළට යන ඥාති සබඳතා
2. දරුවන්, දරුවන්ගේ දරුවන් මේ වාගේ පහලට යන ඥාති සබඳතා
3. තමන්ගේ මව, පියා හෝ ඔවුන්ගේ කෙනකුගේ දරුවන් ඔවුන්ගේ දරුවන්ගේ දරුවන් යන අයුරින් පහළට යන ඥාති සබඳතා. ඒ අනුව තමන්ගේ ම සහෝදරියන්, අඩ සහෝදරියන් හා එම සහෝදරියන්ගේ දරුවන් මෙහි දී සැලකේ.
4. තමන්ගේ ඥාති සීයා, ආච්චිගේ දරුවන්. මෙය පළමු පියවරෙන් නතර වෙයි. මවගේ හෝ පියාගේ සහෝදරිය හා විවාහ වීම සුදුසු නැත. නමුත් ඔවුන්ගේ දරුවන් සමග විවාහ වීම අනුමත කර ඇත.

විවාහ සඳබතා නිසා විවාහ වීම අනුමත නොවන්නන්

1. බිරිඳගේ මව, බිරිඳගේ මවගේ මව යනුවෙන් ඉහළට ගමන් කරන ඥාති සබඳතා
2. බිරිඳගේ දරුවන්, බිරිඳගේ දරුවන්ගේ දරුවන් මේ අයුරින් පහළට ගමන් කරන ඥාති සබඳතා.
3. පුතාගේ බිරිඳ, පුතාගේ පුතාගේ බිරිඳ, මේ අයුරින් පහළට යන ඥාති සබඳතා
4. පියාගේ බිරිඳ

කිරි බීමෙන් විවාහ වීම අනුමත නොවන්නන්

තමාගේ මව නොවන ස්ත්‍රියකු ළඟ කිරි බීමෙන් ද විවාහ සබඳතා පැවැත්විය නො හැකි තත්ත්ව ඇති වේ. කිරි බීම නිසා පහත සඳහන් අය විවාහ වීම අනුමත නොවන්නේ ය.

1. කිරි දුන් ස්ත්‍රිය
2. කිරි දුන් ස්ත්‍රියගේ මව
3. කිරි දුන් ස්ත්‍රියගේ ස්වාමියාගේ මව
4. කිරි දුන් ස්ත්‍රියගේ සහෝදරිය
5. කිරි දුන් ස්ත්‍රියගේ ස්වාමියාගේ සහෝදරිය
6. කිරි දුන් ස්ත්‍රියගේ ස්වාමියාගේ දරුවන් හා දරුවන්ගේ දරුවන්
7. ස්ත්‍රියක ළඟ කිරි බීමෙන් සබඳතා ඇති වන සහෝදරිය.

කිරි බීමෙන් මහ්රම් වීමට පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ විය යුතු ය.

(අ) අවුරුදු දෙකක් තුළ දී ළදරුවකු ව සිටි අවස්ථාවේ කිරි බිව් තැනැත්තකු වීම.
(ආ) තනේ කට තියා උරා බී තිබීම.
(ඉ) අවම වශයෙන් උගුරු පහක් හෝ බී තිබීම.

තාවකාලික මහ්රම්

1. සම කාලයේ එකට උපන් සහෝදරියන් දෙදෙනකු බිරින්දෑවරුන් ලෙස තබා ගැනීමට නොහැක.
2. ස්ත්‍රියක හා ඇයගේ පියාගේ සහෝදරිය සම කාලයේ දී බිරින්දෑවරුන් ලෙස තබා ගැනීමට නො හැක.
3. ස්ත්‍රියක හා ඇයගේ මවගේ සහෝදරිය ද සම කාලයේ දි බිරින්දෑවරුන් ලෙස තබා ගත නො හැක.
4. විවාහ වූ ස්ත්‍රිය, කෙනකුගේ බිරිඳ ලෙස සිටිනතාක් තවත් අයකුට විවාහ වෙන්නට නො හැක.
5. තුන් වතාවක් තලාක් කියන ලද ස්ත්‍රිය පළමු ස්වාමියාට තාවකාලික ව විවාහ වීමට අනුමත නොකළ තැනැත්තා වේ.
6. මුෂ්රික් වූ ස්ත්‍රියකට විවාහ වීමට නොහැක.
7. ගණිකා වෘත්තියේ යෙදෙන ස්ත්‍රින් පවු සමා කිරීම අයැද පවෙන් මුළුමනින් ම මිදී පවිත්‍ර වන තුරු ඔවුන්ට විවාහ වීම තාවකාලික ව තහනම් වේ.

විවාහ වීමට අනුමත කරන ලද්දන් "අජ්නබි" ලෙස ද විවාහ වීමට අනුමත නොමැති අය "මහ්රම්" ලෙස ද සඳහන් වේ.

නිකාහ් අනුමත වීමට නම් පහත සඳහන් දේ අවශ්‍ය වේ. (ෂර්ලු)

1. මනමාලයා හො මනමාලිය
2. ඊජාබ් කබූල්
3. වලී
4. සාක්කි

විවාහ ගිවිසුම අයිති පාඨයක මෙන් ම මෙම කරුණු හතරට ම සබැඳි සුවිශේෂී කියමනයක් ඇත.

මනමාලයා

- මුස්ලිම් වීම
- සම කාලයේ ස්ත්‍රීන් සිව් දෙනකු බිරින්දෑවරුන් ලෙස නොමැති පුද්ගලයකු වීම.
- මනමාලියට අජ්නබි වීම
- හජ් වන්දනාවට ඉහ්රාම් නොපැළඳූ අයකු වීම

මනමාලි

- මුස්ලිම් වීම හෝ අහ්ලුල් කිතාබ් වීම
- තවත් අයකුගේ බිරිඳ නොවීම
- ඉද්දා නොසිටිය යුතු ය.
- හජ් වන්දනාවට ඉහ්රාම් නොපැළඳිය යුතු ය.

ඊ ජාබ් (භාරදීම)

මනමාලි මනාමාලයාට භාර දුන් බව ප්‍රකාශ කරනු වස් මනමාලියගේ භාරකාරත්වය 'වලි' පවසන පදය ඊජාබ් ලෙස හැඳින්විය හැක. "අන්කහ්තුක", "සව්වජ්තුක" යන පද භාවිත කිරීම වඩාත් උචිත වූ නමුත් තමා දන්නා භාෂාවෙන් ඊජාබ් කබූල් ඉටු කළ හැක.

කබූල් (පිළිගැනීම)

වලි විසින් භාරදෙනු ලැබූ මනමාලිය තමා පිළිගත් බවට මනමාලයා විසින් කියන පදය කබූල් වේ.

ඊජාබ් කබූල් යනාදි දෙක අතර කාලය ගත නොකළ යුතු ය.
ස්ත්‍රීයකට ස්වයං ව විවාහ විය නොහැක. ස්ත්‍රියකට තවත් ස්ත්‍රියක විවාහය කර දීමට වලී ලෙස පෙනී සිටීමට ද නොහැක. (ඉබ්නු මාජාහ්)

වලීගේ අනුමැතිය නොමැති ව ස්වයං විවාහ වූ විවාහය වලංගු නොවේ. ඒ නිසා මේ අයිතිය ස්ත්‍රියක විවාහය කර දී ඇයගේ භාරකාරු වන වලීට අයත් වේ.

වලී ලෙස සිටීමට පහත සඳහන් අය සුදුසුකම් ලබයි.

1. පියා
2. පියාගේ පියා
3. එක කුසේ උපන් සහෝදරයා
4. පියාගේ මාර්ගයෙන් ඥාති වන අඩ සහෝදරයා
5. එක කුසේ උපන් සහෝදරයාගේ පුතා
6. පියා මාර්ගයෙන් ඥාති වන අඩ සහෝදරයාගේ පුතා
7. පියා සමඟ එක කුස උපන් සහෝදරයා (මහප්පා, බාප්පා,)
8. පියා සමග එකකුස උපන් සහෝදරයාගේ පුතා (මහප්පාගේ, කුඩාප්පාගේ දරුවන්)
9. පියාගේ පියාගේ මාර්ගයෙන් සහෝදරයා
10. පියාගේ පියාගේ මාර්ගයෙන් ඥාති වන අඩ සහෝදරයාගේ පුතා
11 සීයාගේ එක කුස උපන් සහෝදරයා
12. සීයාගේ පියා මාර්ගයෙන් ඥාති වන අඩ සහෝදරයා
13. සීයාගේ පියාගේ මාර්ගයෙන් ඥාති වන අඩ සහෝදරයාගේ පිරිමි දරුවන්
14 නඩුකාරයා (මහේස්ත්‍රාත්) (හාක්කිම්)

මේ අයගේ ප්‍රථමයා නොමැති අවස්ථාව හෝ සුදුසුකම් නොමැති විට එම අයිතිවාසිකම් අනිත් කෙනා ලබා ගනී. වලි තිබීමට සුදුසුකම්.

1. මුස්ලිම් වීම.
2. පිරිමියකු වීම
3. වැඩිවියට පත් වී සිටීම.
4. සිහි බුද්ධිය තිබීම.
5. නිදහස ඇති පුද්ගලයකු වීම.
6. මහා පාපකර්මවල නිරත නොවූවකු වීම.
7. හජ් වන්දනාවට ඉහ්රාම් පැළඳි පුද්ගලයකු නොවීම

සාක්කිකරුවන් (ෂාහිද්)

වලී හා සාක්කි දෙකක් නොමැති නිකාහ් බාතිල් වූ (නොපිළිගත්) නිකාහ් වේ.

ෂාහිද් ලෙස පැමිණෙන්නාගේ කොන්දේසි

ඉහත සඳහන් වලීට තිබිය යුතු සුදුසුකම්වලට අමතර ව

8. ගිවිසුම ඇති කරන භාෂාව දැන සිටිය යුතු ය.
9. කථනය, සවන් දීම, බැලීම වැනි ඉන්ද්‍රිය හැකියාවන් ලබා තිබීම.

ඉහත සඳහන් අංග හා තවත් බෙහෝ වැදගත් අංග ද විවාහය සමග සම්බන්ධ වේ.

මහර් :

විවාහයේ දී මනමාලයා මනමාලිට අනිවාර්යයෙන් ම ලබා දෙන ආධාරය, මහර් වේ. මෙය දීම වාජිබ් වේ.

"නුඹලා (විවාහ වුණු (කාන්තාවන්ට ඔවුන්ගේ මහ්රය ගෞරවයෙන් ලබා දෙන්න."(4 අන් නිසා :5)

මහර් මුදල් වශයෙන් ද භාණ්ඩ වශයෙන් ද, සම්පත් වශයෙන් ද සේවා වශයෙන් ද ලබා දිය හැක. මහර් සඳහන් නොකර විවාහ ගිවිස ගැනීම මක්රූහ් යැයි සමහර විද්වතුන් සඳහන් කර ඇත.

වලීමාව:

සතුටු විය හැකි යමක් සිදු වීම නිමිත්තෙන් පොදුවේ දෙනු ලබන සාදය හැඳින්වීමට වලීමා යන පදය භාවිත වූවත් විවාහ වූ යුවල එක් වූ පසු දෙනු ලබන සාදය හැඳින්වීමට මේ වදන භාවිත කිරීමට පුරුදු වී ඇත. වලීමාව ලබා දීම සුන්නා මුඅක්කා වේ.

මනමාල යුවල ශාරීරික ව එක් වීමෙන් පසු වලීමා ලබා දීම වඩාත් උචිත වූවත් විවාහ ගිවිස ගැනීමෙන් පසු ව වලීමාව දීම ද අනුමත වූවකි. තම උඩඟු බව විදහා දක්වන්නට වියදම් කිරීම යනාදිය වළක්වා ගෙන ඉතා චාම් ලෙස කටයුතු කිරීම විශිෂ්ට ය. ඥාතීන්, යහළුවන්, අසල්වැසියන්, දුප්පත් පොහොසත් යන භේදයකින් තොර ව සියල්ලන්ට ම ආරාධනය කිරීම ඉතා හොඳ ක්‍රියාවකි.

විවාහය සම්බන්ධ නීති රීති ගැන අල් කුර්ආන් හා සුන්නාහ්ව පැහැදිලි ලෙස විග්‍රහ කර ඇත. ඒ උපදෙස් අනුව කටයුතු ඉටු කළ හොත් අල්ලාහ්ගේ දයාදය හා කුසල් ලැබේ.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❖ النِّكَاحُ ❖ السَّكَنُ ❖ الذُّرِّيَّةُ ❖ الْمُحْصَنُ ❖ الْمَحْرَمُ ❖ الإِيْجَابُ
❖ القَبُوْلُ ❖ الْوَلِيُّ ❖ الشَّاهِدُ ❖ الأَجْنَبِيُّ ❖ أَهْلُ الْكِتَابِ ❖ أَنْكَحْتُكَ
❖ زَوَّجْتُكَ ❖ الْمَهْرُ ❖ الْوَلِيْمَةُ

අභ්‍යාසය

1. විවාහයේ වැදගත්කම ගැන සාක්කි මගින් විස්තර කරන්න.
2. විවාහයේ දි ලැබෙන ප්‍රයෝජන වගු ගත කරන්න
3. විවාහය අනුමත වීමට අදළ කොන්දේසි ගැන කෙටියෙන් විස්තර කරන්න.
4. වලීමාව, මහරය යනාදි වචන අතර එකමුතුකම වෙනස් වන ආකාරය සඳහන් කරන්න
5. ඔබ විසින් අවධානයට ලක් කළ යුතු විවාහයේ සිදු වන ෂරීඅතයට විරුද්ධ අංගයන් වගු ගත කරන්න.